## උහන ප්‍රාදේශීය සභාවේ පැවති 07 වන සභා වාරයේ හැටවන සභා රැස්වීම් වාර්තාව

දිනය ඃ- 2023.03.02 පෙ.ව. 9.45

| | | |
|---|---|---|
| 1. | ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා | ගරු සභාපති |
| 2. | එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා | ගරු උප සභාපති |
| 3. | රංජිත් වනිගසිංහ ඒකනායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 4. | ඒ සුසන්ත කුමාර කුසුම්සිරි මය | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 5. | ඩී. ආරියරත්න දෙලංකාවල මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 6. | ඊ.ආර්. සුමනාවති මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 7. | පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 8. | එල්.එච්. කරුණාසේන දයාතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 9. | පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 10. | එන්.ජී. චතුරංග දර්ශන කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 11. | එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 12. | පී.කේ. තරිඳු තුෂාන් ධනංජය මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 13. | කේ.එම්. කුලතුංග මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 14. | එන්.එච්. ලාල් ජයන්තසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 15. | එල්.ආර්. චන්ද්‍රසේකර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 16. | එච්.පී. ජයතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 17. | ආර්.ඒ.ඩී. සිසිර ශාන්ත කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 18. | ඒ.ලලිත් කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 19. | කේ. ප්‍රේමසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 20. | ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 21. | ජේ.පී. සුගන්ධි ෂාවිකා මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 22. | ජේ.ආර්. ජගත් ප්‍රසන්න මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 23. | එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 24. | ඩබ්.ඩී. දර්ශන නුවන් විශ්නදේව මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 25. | ඩී.එම්. සීතා කුමාරිහාමි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |

නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්

| | | |
|---|---|---|
| 1. | කේ.වී.ජී. නයනා කුමුදුනි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 2. | කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 3. | එන්. අමරකීර්ති මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 4. | ඩබ්. රාණි මැණිකේ මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 5. | කේ.බී. විමලරත්න මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 6. | ආර්.එම්. ජයවීර රත්නායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |

01.ආගම සිහිකිරීම හා මියගිය රණ විරුවන් සිහිකිරීම

ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි සියළුම මන්ත්‍රීවරු පිළිගැනීමෙන්ද ආගමික වතාවත් සිදු කිරීමෙන් අනතුරුව රට වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහි කිරීමෙන් පසු පෙ.ව. 9.45 රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදී.

රැස්වීම ආරම්භයේදී ගරු මන්ත්‍රීවරුන් 11දෙනෙක් පැමිණ සිටින ලදී.

| | | |
|---|---|---|
| 1. | ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා | ගරු සභාපති |
| 2. | එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා | ගරු උප සභාපති |
| 3. | ඒ සුසන්ත කුමාර කුසුම්සිරි මය | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 4. | එල්.එච්. කරුණාසේන දයාතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 5. | පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 6. | පී.කේ. තරිඳු තුෂාන් ධනංජය මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 7. | කේ.එම්. කුලතුංග මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 8. | එන්.එච්. ලාල් ජයන්තසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 9. | ආර්.ඒ.ඩී. සිසිර ශාන්ත කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 10. | ඒ.ලලිත් කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 11. | කේ. ප්‍රේමසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |

**02.පසු ගිය මස සභා වාර්තාව ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපතිතුමා**

මා විසින් න්‍යාය පත්‍රය සමග ලැබෙන්නට සැලැස්වූ පසුගිය මස සභා වාර්තාව කියවන ලද සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් නොමැති නම් වාර්තාගත කර ඇති පරිදි ස්ථිර කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඒ. සුසන්ත කුමාර කුසුම්සිරි මහතා විසින් සභා වාර්තාව ස්ථිර කරන ලදි.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත සභා වාර්තාව සම්මත විය.**

**03.ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - නැත**

**04.සන්දේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන - නැත**

**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**යෝජනා අංක 06/2023/03 (01)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් ආදේශක පදනම මත සෞඛ්‍ය කම්කරු ලෙස සේවය කරන ටී.ජී. දිනුෂා හේමමාලි රණවීර මිය හා තාවකාලික පදනම මත රියදුරු ලෙස සේවය කරන එච්.එම්.පී. සඳකැලුම් කරුණාදාස මහතාගේ සේවා කාලය පිළිවෙලින් 2023.06.23 හා 2023.07.08 දිනෙන් අවසන් වන අතර ආදේශක පදනම මත ඩෙංගු හා ජලභීතිකා මර්ධන වැඩසටහන සඳහා කම්කරු ලෙස කටයුතු කරන ඒ.ජී. ප්‍රදීප් ප්‍රේමචන්ද්‍ර මහතාගේ සේවා කාලය 2023.08.21 දිනෙන් හා ගල්රොල යන්ත්‍ර ක්‍රියාකරු ලෙස සේවන කරන ඒ.ආර්.ජී.ඩී.සී.සී. බණ්ඩාර මහතාගේ සේවා කාලය 2023.08.15 දිනෙන් හා මෝටර් ග්‍රේඩර්ය යන්ත්‍ර ක්‍රියාකරු ලෙස සේවය කරන ඩී.එම් දිලාන් තනුජ දිසානායක මහතාගේ සේවා කාලය 2023.09.27 දිනෙන් හා අනිල් දේශන්ත මහතාගේ සේවා කාලය 2023.08.21 දිනෙන් අවසන් වන බැවින් මොවුන් ගේ සේවා කාලය මාස 06 කින් දීර්ඝ කිරීම සඳහා සභාවේ අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදි.

ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ.එම් කුලතුංග මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

එම අවස්ථාවේ පැමිණ රැදී සිටි සියළු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව එම යෝජනාව සම්මත විය.

**යෝජනා අංක 06/2023/03 (02)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් වෙසක් උදානය ගිණුමේ ඇති රු. 516973.49 ක මුදලින් ප්‍ර ෙද්ශයේ පන්සල් වලට හා අඩු ආදායම්ලාභී පවුල් වල වෙසෙන දූ දරුවන්ට පාසල් උපකරණ ලබා දීම සඳහා සභා අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදි.

ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු උප සභාපති**

මෙම මුදල කොට්ඨාස 17 න් බෙදා එම එන මුදල එම කොට්ඨාස වල සිටින මන්ත්‍රීවරු ගණනින් බෙදා වෙන් කර දිය යුතු බව ප්‍රකාශ කරන ලදි. සියළුම මන්ත්‍රීවරුන්ට සාධාරණය වන පරිදි මෙම මුදල බෙදා දීම සිදු විය යුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපති**

මෙම මුදල රජයේ ලැබුණු මුදල් නොවන බවත් මාගේ මහන්සියෙන් උපයාගත් මුදල් බවත් කොරෝනා කාලයේ මෙම මුදල බෙදා දිමට සාකච්ඡා කලත් මා විසින් මේ මුදල්වලින් භාණ්ඩ අරගෙන රාජ්‍ය නිලධාරීන්ට අලෙවි කර මුදල් රැකගත් බවත්, ප්‍රකාශ කරන ලදි. මන්ත්‍රීවරු සියලු දෙනාටම සාධාරණයක් විය යුතු බව සත්‍ය බවත් , නමුත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයාට සාධාරණයක් විය යුතු ආකාරයට මෙම මුදල බෙදී යායුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය**

මෙම මුදල බෙදීමේදී ප්‍රශ්නයක් නොවන ආකාරයට බෙදිය යුතු බවත්, මෙම මුදල කොට්ඨාස 17 න් බෙදා ඒ එන මුදල කොට්ඨාසයේ මන්ත්‍රීවරු ගණනින් බෙදා සභාපතිතුමා පැවසූ ආකාරයට කොට්ඨාසයේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු අනෙක් පක්ෂ වල මන්ත්‍රීවරු සමඟ සාකච්ඡා පවත්වා එම මුදල් බෙදා ගෙන කටයුතු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි. මෙලෙස සුදුසු ආකාරයට කටයුතු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

ඉහතින් මන්ත්‍රීවරු දැක්වූ අදහස් පරිදි මෙම රු. 516973.49 ක වෙසක් උදාන ගිණුමේ ඇති මුදල කොට්ඨාස 17 බෙදා එම එන මුදල කොට්ඨාස මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත පරිදි කොට්ඨාසයේ මන්ත්‍රීවරු ගණනින් බෙදා එම මුදලින් අඩු ආදායම්ලාභී පවුල් වල වෙසෙන දූ දරුවන්ට පාසල් උපකරණ ලබා දීම සුදුසු බව තීරණය කරන ලදි. එම තීරණය එම අවස්ථාවේ පැමිණ රැදී සිටි සියළු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව එම යෝජනාව සම්මත විය.

**යෝජනා අංක 06/2023/03 (03)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් ප්‍රදේශයේ අධික වර්ෂාව හේතුවෙන් හානියට පත්වූ මාර්ග සියල්ල පිළිසකර කර ගැනීම සඳහා සභා අනුමැතියට යෝජනා කර ඉදිරිපත් කරන ලදි.

ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ.එම්. කුලතුංග මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 10.03 ට ගරු ප්‍රා.ස. මන්ත්‍රී. එච්.ජී. ප්‍රියන්ත සිසිර කුමාර මහතා හා ගරු ප්‍රා.ස. මන්ත්‍රීදර්ශන නුවන් විශ්නු දේව මහතා පැමිනෙන ලදි.

ගරු ප්‍රා.ස. මන්ත්‍රී එච්.ජී. ප්‍රියන්ත සිසිර කුමාර මහතා

හානියටපත් වූ මාර්ග පිළිසකර කරන්න යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද හා එසේ පිළිසකර කරන්නේ කෙසේද යන්න විමසන ලදි.

**ගරු සභාපතිතුමා**

මෝටර් ග්‍රේඩරය යොදා පිලිසකර කිරීම බව පැහැදිලි කරන ලදි.

එම යෝජනාව සඳහා එම අවස්ථාවේ පැමිණ රැදී සිටි සියළු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව එම යෝජනාව සම්මත විය.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 10.05 ට ගරු ප්‍රා.ස. මන්ත්‍රී. සීතා කුමරිහාමි මිය පැමිනෙන ලදි.

යෝජනා අංක 06/2023/03 (04)

01. ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් කිලෝමීර් 100,000 වැඩසටහන යටතේ **මාර්ග ව්‍යාපෘති සඳහා මුදල් වෙන්වී ප්‍රසම්පාදන කටයුතු මඟින් කොන්ත්‍රාත් කටයුතු ලබා ගෙන ඇති එහෙත් මේ වන තෙක් මාර්ග පිලිසකර කිරීම් කටයුතු ආරම්භ නොකර ඇති ව්‍යාපෘති නැවත ආරම්භ කරන ලෙසත් එසේ නොමැතිනම් කොන්ත්‍රාත්කරුවන් සඳහා ප්‍රාදේශිය සභාවේ අදාල කොට්ඨාස වල මහජන නියෝජිතයන්ගේ සහ ප්‍රාදේශිය සභාවේ විමසීමකින් තොරව මුදල් ලබා දීම් කටයුතු කරන බවට ආරංචි ඇති නමුත් එසේ නොකරන ලෙස මහාමාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යැවීම සඳහාත් අදාල කොන්ත්‍රාත්කරුවන් අසාධුගත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා සභා අනුමැතියට යෝජනා කර ඉදිරිපත් කරමි.**

    01. **හිමිදුරාව 12 ඇල මංසන්දියේ සිට අභයපුර දක්වා මාර්ගය කාපට් කිරීම - නවලෝක කන්ස්ට්‍රක්ෂන්** 6Km

02. හිමිදුරාව 12 ඇල 4/35 නිවස අසල සිට ඉදිරියට මාර්ගය කොන්ක්‍රීට් කිරීම 3 ½ Km

03. උහන පොල්වගා මණ්ඩලය අසල සිට මාර්ග කාර්පට් කිරීම – 6 Km නවලෝක කන්ස්ත්‍රක්ෂන්

04. ගලහිටියාගොඩ ග්‍රාමීය මාර්ග පිලිසකර කිරීම – 10 Km

05. ගලහිටියාගොඩ සැටල් හංදියේ සිට වැලිකහගොල්ල දෙමටමල්පැලැස්ස ග්‍රාමීය අභ්‍යන්තර මාර්ග – 6 ½ Km ගාමා කන්ස්ත්‍රක්ෂන්

06. මායාදුන්න ග්‍රාමීය මාර්ග කාර්පට් කිරීම 7 Km - නවලෝක කන්ස්ත්‍රක්ෂන්

07. කුමාරිගම ගම අභ්‍යන්තර මාර්ග – 4 Km

08. වළගම්පුර ලාතුගල ග්‍රාමීය මාර්ග – 10 Km

ඉහත සඳහන් මාර්ග සහ අනෙකුත් මාර්ග කොන්ත්‍රාත් ලබා ගෙන ඇති ආයතන අසාධු ගත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා සභා අනුමැතියට යෝජනා කර ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.**

**ගරු සභාපතිතුමා**

ඉහත යෝජනාවට අනුව මෙම සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් කරන ලෙස මහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීමක් කරන බවත්, ඒ සම්බන්ධයෙන් ඒ ඒ මාර්ග සඳහා ලබාගෙන තිබෙනවාද ඒ මුදල් කුමණ වැඩකටයුත්තකට භාවිතා කර තිබෙනවාද යන කරුණු ගැන විධිමත් පරීක්ෂණයක් සිදු කරන ලෙසත් තොරතුරු දැනගැනීමේ පනත යටතේ මා විසින් මේ සම්බන්ධව විමසීමක් කිරීමට බලාපොරොත්තු වන බවත්, මේ මාර්ග මෙසේ වැඩ අවසන් නොකර නැවතී තිබෙන්නේ මන්ද යන්න විමසා බැලීමට බලා පොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදි. මෙම පාරවල් ලබා ගෙන තිබෙන කොන්ත්‍රාත්කරුවන් පාඩුවේ සිටියදී ගමේ මහජන නියෝජිතයන් බැනුම් අසන බවත්, පාරවල් හදන්නට පටන් අරගෙන අතරමඟ නතර කර තිබෙන්නේ එම පාරවල් වලින් කොමිස් ගසා ගෙන බවත්, මහජනතාව චෝදනා කරන බවත්, එම චෝදනා වලින් මහජන නියෝජිතයින් නිදහස් විය යුතු බවත්, පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය**

මෙම යෝජනාව ගෙන ඒම පිළිබඳ ඔබතුමාට ස්තුති වන්ත වන අතර, කිලෝමීටර් ලක්ෂයේ වැඩසටහනේ මායාදුන්නේ කොට්ඨාසයට කිලෝමීටර් 07 ක් ලැබුනු බවත්, නමුත් මෙයින් ගොඩක් දුරට බැනුම් ඇහුවේ බැට කැවේ ඔබතුමා කියන ආකාරයට මායාදුන්න කොට්ඨාසයේ මන්ත්‍රීතුමිය ලෙස මා බවත් කන්ට්‍රක්ෂන් ආයතනය කොළඹ ටෙන්ඩර් බෝඩ් එකෙන් ටෙන්ඩර් ලබා ගෙන ගමට පැමිණි පසු තමයි අපි දන්නේ මෙම ආයතනය මඟින් මෙම කටයුත්ත කරන බව වටේට තිබෙන කොට්ඨාස වල අතුරු පාරවල් පවා NEM ආයතන වලින් කාර්පට් කරද්දී වසර ගණනාවටම ගමේ ජනතාවගේ මා විශාල ලෙස බැනුම් ඇසූ බවත්, මොකද එයාලා හිතන්නේ අපිට මේ දේවල් කර ගැනීමට කොන්ද පණ නැති බවයි. අපිට අපේ රජයෙන් ලක්ෂයේ වැඩසටහන යටතේ කිලෝ මීටර් 07 ½ ලැබුනට එහි නම්බුව විඳින්නට අපට නොහැකි වූ බවත්, ඒ පිලිබඳව පුදුම දුකක් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදි. ඉදිරියේදී මැතිවරණයක් එන විට ගමේ මිනිස්සුන්ට මුහුණ දීමට නොහැකි බවත්, මොකද වටේම තිබෙන කොට්ඨාස වල පාරවල් හදා ඇති බවත්, මගේ ගමේ කිලෝමීටර් 1 මීටර් 800 ක් කොන්ක්‍රීට් කළ බවත්, එසේම කිලෝමීර් 41 ½ කට ABC දමා ඇති බවත් පසුගිය කාලයේම පුස්සයිකලේ ටයර් ගියාම ඒ බයිසිකලය තල්ලු කරගෙන මගේ ගෙදරට ඇවිත් මට බනින බවත් ABC දමල විතරක් තිබෙන නිසා මේ මාර්ග වල යාමට නොහැකි බව පවසන බවත්, ප්‍රකාශ කරන ලදි. මිනිස්සු එහෙම තමයි මඩේ ගියාට ඒක ප්‍රශ්නයක් නැති බවත්, ABC දමා හෝ වැඩේ බාගයකට හෝ කරාට ඇගිල්ල දික් කරන්නේ ගමේ සිටින මහජන නියෝජිතයාට බවත්, පසුගිය ටිකේම මිනිසුන් කියා සිටියේ මම නවලෝක ආයතනයෙන් කොමිස් අරගෙන ඒ නිසා භාගෙට වැඩ කර

නතර වී සිටින බවයි. මන්ත්‍රීතුමිය කොමිස් ගන්න නිසා දැන් සද්ද නොකර සිටින බව මිනිසුන් පවසා සිටින බව පෙන්වා දෙන ලදි. පසුගිය ටිකේම මට මලගෙදරකට,දානේ ගෙදරකට, පිංකම් ගෙදරකට යන්නට බැරි තත්වයක් උදා වී තිබූ බවත් හැම මොහොතකම මෙම පාර මූලික කරගෙන මට චෝදනා කරන බව ප්‍රකාශ කරන ලදි. එසේ අපහසුතාවයන් වලට පත් වූ අවස්ථා තිබූ නිසා දේශපාලන ජීවිතයෙන් සමු ගන්නට සිතූ බවත් ප්‍රකාශ කරන ලදි. කිලෝමීටර් 07 ක් ලැබුණට ඒක අපිට ඒ ආකාරයට කරගන්නට නොහැකි වූ බවත්, නවලෝක වැනි දුර්වල සමාගම් වලට මින් ඉදිරියට මේ ආකාරයෙන් කොන්ත්‍රාත් ලබා නොදෙන ලෙස මම ඉතා කරුණාවෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදි. විමලවීර ගරු ඇමතිතුමා කීප විටක්ම මායාදුන්න කොට්ඨාසය,හිමිදුරාව කොට්ඨාසය, ආදී නවලෝක සමාගම විසින් කරන ලද පාරවල් අයිති හැම දෙනාම ගෙන්වා සාකච්ඡා කල බවත්, මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ද ගෙන්වා කිහිප විටක්ම මෙම පාරවල් නිමකරන ලෙස උපදෙස් ලබා දුන් බවත්, නමුත් හැමදාම මේ අය බොරු පවසා මගහැරිය බවත්, ලබන මාසේ පටන්ගන්නවා,ඊළඟ මාසේ පටන් ගන්නවා ආදී ලෙස පවසා මඟ හැරිය බව ප්‍රකාශ කරන ලදි. මේ නිසා මෙවැනි දුර්වල සමාගම් වලට වැඩක් භාර දෙන්න එපා යැයි මා ඉල්ලා සිටින බවත්, ඔබතුමා මේ ආකාරයට මෙවැනි යෝජනාවක් ගෙනවිත් ගත් පියවර සම්බන්ධයෙන් ඇත්තටම සතුටු වන බව ප්‍රකාශ කරන ලදි. මේ අයගේ වැඩ කටයුතු නිසා ගමේ සිටින් මන්ත්‍රී විශාල වශයෙන් බැට කන බවත් ප්‍රකාශ කරන ලදි. NEM, MAGA ආයතනය හොඳින් වැඩක් කරද්දී වටේම කොට්ඨාස වල පාරවල් හැදෙද්දී අපේ ගමේ පාරවල් හැදෙන්නේ නැති වුනාම මිනිසුන් හිතන්නේ මේක අපේ දුර්වලකමක් ලෙසයි. නමුත් අප විසින් මේ කොන්ත්‍රාත්කරුවන්ට මේවා ලබා නොදුන් බවත් ප්‍රකාශ කරන ලදි. එයාලා ටෙන්ඩර් බෝඩ් වලින් ගන්නේ නමුත් ගමේ මිනිස්සු සිතන්නේ මේවා අපි ලබා දෙන ඒවා බවයි. ඒ නිසා මිනිසුන් අපේ දුර්වල කම් ලෙස මේවා දකින බව ප්‍රකාශ කරන ලදි. මේ ගෙන ආ යෝජනාව ඉතාම හොඳ බවත්, මෙය ඉතා ඉක්මණින් ක්‍රියාත්මක කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි. ඉදිරියේදී පත් වන ඕනෑම රජයකින් ඉල්ලා සිටින්නේ මෙවැනි දුර්වල ආයතන වලට කොන්ත්‍රාත් ලබා නොදෙන ලෙස නැවත ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 10.10 ට ගරු ප්‍රා.ස. මන්ත්‍රී. ඩී.ඒ. දෙලංකාවල මහතා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 10.15 ට ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරී මිය පැමිනෙන ලදි.

**ගරු සභාපතිතුමා**

මගේ කොට්ඨාසයේ හා උප සභාපතිතුමාගේ කොට්ඨාසයේ, චතුරංග මන්ත්‍රීතුමාගේ කොට්ඨාසයේ,ප්‍රේමසිරි මන්ත්‍රීතුමාගේ කොට්ඨාසයේ, චන්ද්‍රසේකර මන්ත්‍රීතුමාගේ කොට්ඨාසයේ ආදී කොට්ඨාස වල සංවර්ධන කටයුතු වල NEM ආයතනය හා MAGA ආයතනය ඉතා සාර්තක ලෙස තමන්ගේ කටයුතු සිදු කල බවත් එම ආයතන දෙක සඳහා මාගේ හා සභාවේ ස්තූතිය මේ අවස්ථාවේ දී පුදකරන බවත් ප්‍රකාශ කරන ලදි. ඔවුගේ වගකීම් ඔවුන් හරියටම සිදු කළ බවත් ප්‍රකාශ කරන ලදි. නමුත් මෙම ආයතන වලින් මහජනතා නියෝජිතයින් කොමිස් ගන්න බව හැමතැනම කසුකුසුවක් යන බවත් එසේ අප විසින් ඔවුන්ගෙන් කොමිස් ගන්න බව ඔප්පු කර පෙන්වන ලෙසත්, එසේ ඔප්පු කර පෙන්නුවොත් නැවත දේශපාලනයට නොඑන බවත් මා අභියෝග කර සිටින බව ප්‍රකාශ කරන ලදි. මිනිස්සු තැන් තැන් වල අපට චෝදනා කලත් උභන ප්‍රාදේශීය සභාවේ කිසිම මහජන නියෝජිතයෙකු ඔවුගෙන් කිසිම මුදලක් ලබා ගෙන නොමැති බව මට වගකීමෙන් කීමට හැකියාව තිබෙන බව ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 10.20 ට ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඊ.ආර්. සුමනාවතී මිය පැමිනෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 10.22 ට ගරු ප්‍රා.ස. මන්ත්‍රී ජේ.ජී. සුගන්ධි ෂාවිකා මිය පැමිනෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 10.23 ට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එච්.ජී. ජයතිලක මයා පැමිනෙන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ.එම් කුලතුංග මහතා**

හිමිදුරාව කොට්ඨාසයේ මන්ත්‍රීතුමා ලෙස ග්‍රාමීය මාර්ග පිළිබඳ දැනුවත් කිරීමක් කල යුතු බවත්, හිමිදුරාව අභයපුර කොට්ඨාසයට කිලෝ මීටර් 12 ක ප්‍රමාණයක් ලැබුණු බවත් නමුත් ඒවා නියමිත පරිදි නිම කර නොමැති බවත්, ඊ සිටි ලංකා නැමති කන්ස්ට්‍රක්ෂන් ආයතනය මෙම පාර අරගෙන ඇති බවත්, එයින් කිලෝමීටර් 2.6 ක ABC දමා ඇති බවත් නවලෝක ආයතනයෙන් කිලෝමීටර් 7 ක් ලබා ගෙන ඇති බවත් හිමිදුරාව 7 ඇල මාර්ගයේ සිට අභයපුර දක්වා මාර්ගය බවත් ප්‍රකාශ කරන ලදි. මේ ගම තුල ජීවත් වන්නේ ගොවිතැන මූලික කරගත් මිනිසුන් බවත්, ප්‍රධාන ගමන් වාහනය වන්නේ පා පැදිය බවත්, ප්‍රකාශ කරන ලදි. බයිසිකලයෙන් යන මිනිස්සුන්ට මන්ත්‍රීතුමිය පැවසූ ආකාරට ලොකු අවදානමක් තිබෙන බවත් බයිසිකලයේ පැච් එකක් ගියොත් එහි වගකීම මන්ත්‍රීවරයා භාර ගත යුතු බවත්පෙන්වා දෙන ලදි. ඒ තත්වයට පත් කර තිබෙන්නේ මේ කොන්ත්‍රාත් ආයතනය බවත් කවුරුහෝ මේ ආයතනයට කොන්ත්‍රාත් එක ලබා දුන් පසු මේ කොන්ත්‍රාත්කරුවන්ට මේ කාර්ය සිදු කළ හැකි දැයි සොයා බැලීමට ඔවුන් දැන ගත යුතු බවත් පෙන්වා දෙන ලදි. ඒ පිළිබඳ කිසිදු වගකීමක් නොගෙන කොන්ත්‍රාත්කරුවන්ට මේ අවස්ථාව ලබා දී ඇති බව හැගෙන බවත් ප්‍රකාශ කරන ලදි. ගමේ පාරේ අඩුපාඩු නිර්මාණය වන විට ගමේ මිනිසුන් ගැටළු ඇති කරන්නේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා හරහා වන බව පෙන්වා දෙන ලදි. ගරු මන්ත්‍රීතුමිය පෙන්වා දුන් පරිදි අපට පණ නෑ යැයි ඔවුන් ප්‍රකාශ කර සිටින බව පැහැදිලි කරන ලදි. අනෙක් පාරවල් සමඟ සන්සංධනය කිරීමේදී විශේෂයෙන් NEM ආයතනය හා MAGA ආයතනය ගැන සන්සංධනය කර මිනිසුන්කතා කරන බවත්, මගේ හිමිදුරාව කිලෝමීටර් 07 ක් NEM ආයතනයෙන් කල පාර ඉතා විශිෂ්ඨ ලෙස කළ බවත් එතැන සිටන් පටන් ගෙන ඉතුරු කිලෝමීටර් 06 හි ප්‍රශ්නය තිබෙන බවත්, මිනිසුන් කෙලින්ම ඇගිල්ල දිගු කර විමසන්නේ එම නිසා බවත්, ප්‍රකාශ කරන ලදි. අපිට ප්‍රාදේශීය මට්ටමින් ගන්න පුලුවන් මැදිහත් වීමක් ලෙස ගරු ඇමතිතුමාට දැනුවත් කල බවත්, ඇමතිතුමා කැඳවා මේ ආයතන සමඟ විශේෂ සාකච්ඡාවක් කළ බවත් අවසානයේ දී ඔවුන් එතැනදී මෙය කරන්නම් යැයි පොරොන්දු වන බවත්, නමුත් ගම ගිය පසු එය සිදු නොවුනු බවත් ප්‍රකාශ කරන ලදි. හිමිදුරාව වැව තෙක් දැනට යන්න තිබෙන පාර යන්නම බැරි බවත් මිනිසුන් මාගෙන් ඉල්ලා සිටින්නේ අඩුම තරමේ ඉස්සර තිබුණු පාර හදා දෙන ලෙසයි. මිනිසුන් පවසන පරදි ඔය ගල්ටික අයින් කර ඉස්සර තිබුණ ආකාරයට පාර සකස් කර දෙන ලෙසට නවලෝක ආයතනයෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදි. මෙය අවසාන සභාවෙන් හෝ මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳ ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වන බව ප්‍රකාශ කරන ලදි. අපේ ප්‍රධාන අරමුණ පොදු දේවල් ටිකක් කිරීම බවත් අඩුමතරමේ 50% ක් වත් අපේ මන්ත්‍රීකාලයේ කරන්නට බැරි නම් ඒ මන්ත්‍රීතුමා අසමත් බවත් ප්‍රකාශ කරන ලදි. අපට ලැබුණ දේ ක්‍රියාත්මක නොවීම සම්බන්ධව අතිශය කණගාටු වන බවත් ප්‍රකාශ කරන ලදි. මිනිසුන්ගේ පැත්තෙන් ගත් විට ඒ මිනිසුන්ගේ බයිසිකල් වල විනාශ වීම පිළිබඳ ඔවුන්දොස් නැගීම සාධාරන බවත් පුලුවන් නම් ABC දමපු කිලෝමීටර් 02 හෝ අස්කර පරණ පාර හෝ හදා දෙන ලෙස අවසාන වශයෙනුත් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 10.25 ට ගරු ප්‍රා.ස. මන්ත්‍රී පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි පැමිනෙන ලදි.
ගරු සභාපතිතුම

අපේ ප්‍රදේශයේ සිටින පොඩි කොන්ත්‍රාත්කරුවන් හඳුනා ගෙන ආණ්ඩුව කටයුතු කළා නම් මෙවැනි ප්‍රශ්න පැන නොනගින් බව ප්‍රකාශ කරන ලදි. එසේ ගම් වල සිටින කොන්ත්‍රාත්කරුවන් සාර්ථකව වැඩය නිම කර ඇති බව ප්‍රකාශ කරන ලදි. ලොකු ලොකු කොන්ත්‍රාත්කරුවන්ට මේවා ලබා දීම නිසා ගැටළු ඇති වී ඇති බව පෙන්වා දෙන ලදි. එය ඉදිරියේදී වත් නිවැරදි කර වැඩකටයුතු සිදුවේ යැයි විශ්වාස කරන බවත් ප්‍රකාශ කරන ලදි. ඔබේ කොට්ඨාස වල මාර්ග වල යම් ගැටළුකාරී තත්වයන් තිබෙනවා නම් ගමේ මිනිසුන් එකතු කර ගෙන පාරට බැසිමට සුදුසු කාලය පැමිණ ඇති බව ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 10.26 ට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එන්.ජී. චතුරංග දර්ශන කුමාර මහතා පැමිනෙන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඊ.ආර්. සුමනාවතී මිය**

ගරු සභාපතිතුමනි පාරවල් ගැන කියන විට ඉතා කණගාටු බවත්,ගොනාගොල්ල කොට්ඨාසයේ කිලෝමීටර් 2 1/2 ක් ලැබුණු බවත් අනෙක් හැම පාරක්ම පොඩි පොඩි කෑලි වශයෙන් මීටර් 100 ක් හො මීටර් 200 ක් වශයෙන් හදා ඇති බවත්, ගොනාගොල්ල දොර පහ හංදියේ සිට මීටර් 700ක් හංදියෙන් ශාන්ත කන්ස්ත්‍රක්ෂන් භාර ගත් බවත් එයට ABC දමා තුනී කර ඇති නමුත් අවශ්‍යතාවය පරිදි උවමනා ප්‍රමිතියට එය කර නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. එසේ ප්‍රමිතියක් නැති නිසා එම ගල්කැට උඩ යන විට අපෙ ඉමාලි මන්ත්‍රීතුමිය පැවසූ පරිදි වාහනවල පැච් යන බව ප්‍රකාශ කරන ලදී. එවැනි දේ සිදුවූයේ අප අවධානය යොමු කළ අතර, කන්ස්ට්‍රක්ෂණ් භාර ගත් කන්ස්ට්‍රක්ෂන් ආයතනයේ වැරදි නිසා බව ප්‍රකාශ කරන ලදී. අම්පාර නන්දියෙස් ශාන්ත කියූ විට ඕනම කෙනෙක් දන්නා බවත් එයාලා වැඩ කරනවාද නැද්ද කියන්නත් දන්නා බවත් පුද්ගලයා හදුනාගෙන එම කොන්ත්‍රාත්තුව භාර දුන්නා නම් සමහර විට කි.මී. 3 මී. 700 අවසන් කරන්නට තිබූ බව පෙන්වා දෙන ලදී. මිනිසුන් මේ පිළිබඳව අපට චෝදනා කරන බව ප්‍රකාශ කරන ලදී. නමුත් මී. 100, මී. 200 වගේ ගත් කොටස් වල වැඩ අවසන් කර ඇති බවත් ඒ පාරවල් අපේ අධීක්ෂණය යටතේ හොඳ විදිහට කර ගත් බව ප්‍රකාශ කරන ලදී. එවැනි තත්ත්වයන් උඩ අපට දෝෂාරෝපණය පමණක් ලැබෙන බව ප්‍රකාශ කරන ලදී.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 10.30 ට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එල්.ආර්. චන්ද්‍රසේකර මහතා පැමිණ අසුන් ගන්නා ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ. ප්‍රේමසිරි මහතා**

ගරු සභාපතිතුමනි, රුහුණුගම කොට්ඨාසයේ ඊසිට් ලංකා ආයතනයෙන් පාර හදන්න ගත් නමුත් බාගෙට එය සිදු කර අතඇරලා දමා ගොස් ඇති බව ප්‍රකාශ කරන ලදී. ගොවි සංවිධාන මඟින් පාරවල් හදන්න මී. 100 වගේ භාර දුන් බවත් ඒවාට කුමක් සිදුවූවේ දැයි විමසන ලදී. ගොවි සංවිධාන වලින් අපට බනින බවත් ගොවි සංවිධානයේ මුදල් අපි අරගෙන විනාශ කළා යැයි චෝදනා කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 10.35 ට ගරු ප්‍රා.ස. මන්ත්‍රී එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මහතා පැමිණ අසුන් ගන්නා ලදී.

**ගරු සභාපතිතුමා**

අද දිනයේ සාකච්ඡා වුන කාරණා අනුව කොන්ත්‍රාත් කරුවන් අසාධුගත ලේඛනගත කිරීම සඳහා ඉතා ඉක්මනින් ලිපි ලේඛන යවන ලෙස ප්‍රකාශ කරන ලදී. අපි මෙවැනි දේවල් සිදු නොකළොත් අපි ඒ සඳහා ඒ කොන්ත්‍රාත්කරුවන්ට උදව් කරනවා යැයි මිනිසුන් සිතන බවත් එමනිසා ඉතා ඉක්මනින් මේ කටයුත්ත සිදුවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව එම යෝජනාව සම්මත විය.**

**යෝජනා අංක 06/2023/03(05)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පුරා ඇති වීදි ලාම්පු අළුත්වැඩියා කිරීමට තිබෙන මුදල් ප්‍රතිපාදන අනුව විදුලි බුබුළු මිළදී ගැනීමට සභා අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ආර්.ඒ.ඩී. සිසිර ශාන්ත කුමාර මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒම යෝජනාව සම්මත විය.**

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 10.45 ට ගරු ප්‍රා.ස. ජේ.ආර්. ජගත් ප්‍රසන්න මහතා පැමිණ අසුන් ගන්නා ලදී.

**යෝජනා අංක 06/2023/03(06)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින්, සමනබැද්ද සහ වැරැන්කැටගොඩ හෙස බොජුන් හල සඳහා කඩිනමින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් මහජනතාවට සේවයක් වන පරිදි අවශ්‍ය කටයුතු කිරීමට සහා අනුමැතිය සඳහා යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ඊ.ආර්. සුමනාවති මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී එන්.ජී. චතුරංග දර්ශන කුමාර මහතා**

සමූපකාර භූමියේ වැරැන්කැටගොඩ ගොඩනැගිල්ල සාදා ඇති බවත් සභාපතිතුමාත් සමඟ සාකච්ඡා කොට සභාවෙන් එය ක්‍රියාත්මක කරන තුරු කාන්තා සමිතියක් මඟින් එය පවත්වාගෙන යන බවත් එළවළු, කොළ කැඳ ආදී දේ එම ස්ථානයේ වෙළඳාම් කරන බවත් කාන්තාවන් 13 දෙනෙකු පමණ දින බෙදා ගෙන වෙළඳාම් කරන බව ප්‍රකාශ කරන ලදී. ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී එම සමිතියත් සමඟ සාකච්ඡා කොට ඔවුන්ට අසාධාරණයක් නොවන පරිදි ක්‍රියාත්මක කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා**

එය තුළින් සභාවටත් ආදායමක් එන ආකාරයට ප්‍රසම්පාදන කටයුතු කිරීම සිදු කිරීමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදී. ප්‍රසම්පාදන කටයුතු වලට අවශ්‍ය ලියකියවිලි ඉතා කඩිනමින් සිදු කරන ලෙස ලේකම්තුමියට උපදෙස් දෙන ලදී. එම ගොඩනැගිල්ල ශ්‍රියානි විජේවික්‍රම මැතිණියගේ ප්‍රතිපාදන යටතේ රු. 2,000,000.00 ක ව්‍යාපෘතියක් බව පැහැදිළි කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා**

ගරු සභාපතිතුමනි, පොඩි පැහැදිළි කිරීමක් කර ගැනීමට අවශ්‍ය බවත් මෙම ව්‍යාපෘතියේ ගොඩනැගිල්ල එක් අයෙකුට බදු දීමට ප්‍රසම්පාදන කටයුතු සිදු කරනවාද නොඑසේනම් කොටස් වෙන්කර එක් එක් අයට දිය හැකි බවත් එසේ සිදුවනවාද යන්නත් විමසන ලදී. චතුරංග මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට වැරැන්කැටගොඩ ගොඩනැගිල්ල වැසී ගොස් තිබූ නිසා කාන්තාවන් ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා මෙය යොදා ගෙන ඇති බවත් ආහාර ද්‍රව්‍ය අලෙවි කරනවානම් එම ආහාර ද්‍රව්‍ය වෙන් කර හඳුන්වා දිය යුතු වේවි යැයි ප්‍රකාශ කරන ලදී. සභාව මඟින් භූමිය වෙන් කර වර්ග අඩි ප්‍රමාණය හඳුනාගෙන එක් අයෙකුට වර්ග අඩි කොපමණ ලබා දෙනවාද ආදී ලෙස හඳුනාගෙන කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී. විවිධ කෑම වර්ග වලින් එක් එක් අයට වෙළඳාම් කිරීමට උපදෙස් ලබා දීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. ප්‍රථමයෙන් මා ඇසූ ප්‍රශ්නය අසන බවත් මෙය පොළක් බදු දෙන ආකාරයට බදු දෙනවාද නොඑසේනම් තනි තනිව බදු දෙනවාද යැයි විමසන ලදී. මෙහි වෙළඳාම පුරුදු වන තුරු ප්‍රාදේශීය සභාවට සාමාන්‍ය ආදායමක් ලැබුනොත් ප්‍රමාණවත් බව ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා**

දෙලංකාවල මන්ත්‍රීතුමා එවැනි ප්‍රශ්නයක් විමසීම ඉතා හොඳ බවත් සමනබැද්ද ගොඩනැගිල්ල හදන ලද සැලසුම සාර්ථක නෑ වගේ හැඟෙන බවත් කඩ වෙන් කර නැති බවත් නිකන්ම ශාලාවක් පමණක් තිබෙන බවත් අපේ කාර්මික නිලධාරියෙකු යවා එය පරීක්ෂා කර යවා අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බවත් පෙන්වා දෙන ලදී. ඒවා වෙන් වෙන් කර සැකසීම සිදු විය යුතු බවත් පැහැදිළි කරන ලදී.

**ගරු උප සභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා**

මේ සම්බන්ධව මීට පෙර යෝජනාවක් ගෙන ආ බවත් ඒ අනුව කටයුතු කරා නම් ප්‍රශ්නයක් නොවන බවත් පෙන්වා දෙන ලදී. එම යෝජනාවේදී විශාල වශයෙන් මන්ත්‍රීවරු අදහස් දැක්වූ බවත් ඒ යෝජනාව අනුව කටයුතු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය**

සමනබැද්ද වාහන නැවැත්වීම සඳහාවත් ඉඩ පහසුකම් තවම සකස් කර නැති හෙයින් එම ස්ථානයේ වෙළඳාම් කටයුතු විශාල ලෙස ලාභ උපයමින් කිරීමට හැකියාවක් ඇති වේවි යැයි නොසිතෙන බවත් යම් ස්ථාවරයකට පැමිණෙන තුරු පොඩි මුදලක් ඇති කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. මෙම ස්ථානය ප්‍රසිද්ධ වන තුරු යම් සහනයක් ලබා දෙන ලෙස පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඒ. සුසන්ති කුමාර කුසුම්සිරි මහතා**

ගරු සභාපතිතුමනි, අපට යම් සහන කාලයක් මාසයක් හෝ දෙකක් කිසිදු මුදලක් අය නොකර තමන් කැමති ව්‍යාපාරයක් ආරම්භ කරන්නට ඉඩ දිය යුතු බවත් ඉන් පසු එම ස්ථානයෙන් සභාවට ආදායමක් ලැබෙන පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපතිතුමා**

මේ කාරණයට අදාළ යෝජනාව තිබෙන පරණ සභා වාර්තාව සොයා ගෙන ඒ අනුව කටයුතු කිරීමට බලය දෙන බව ප්‍රකාශ කරන ලදී. දැනට වැරැන්කැටගොඩ වෙළඳාම් කරන අයට ප්‍රමුඛතාවය ලබා දිය යුතු ආකාරයට කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදී. අපේ කාර්මික නිලධාරියෙකු හෙටම යවා වාර්තාවක් ලබා ගන්නා ලෙස ලේකම්තුමියට උපදෙස් දෙන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා**

කලින් සභා වාරයක මේ පිළිබඳව සාකච්ඡා කර ඇති බවත් මා එදින නොසිටින්නට ඇති බවත් එමනිසා මට මතකයක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. අපි ඒ කතා කර ගත් පරිදි කටයුතු සිදු විය යුතු බව සත්‍ය බවත් නමුත් ඒ කාර්ය සභාව යටතේ ක්‍රියාත්මක වන බව මහජනතාවට දැනෙන්නට හැරිය යුතු බව ප්‍රකාශ කරන ලදී. එසේ නොමැතිව මේ අයාලේ යැමට ඉඩ දිය නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. එමනිසා සභාවේ නියාමනයක් විය යුතු බව පෙන්වා දෙන ලදී. ගමේ හොඳයැයි සමිතියකට හෝ මෙය ලබා දී බලමු යැයි ප්‍රකාශ කරන ලදී.

**මේ කාරණාව සම්බන්ධව යෝජනාව තිබෙන මීට පෙර සභා වාර්තාව සොයා ගෙන එහි සාකච්ඡා වූ කරුණු අනුව ගන්නා ලද තීරණය අනුව කටයුතු සිදු කිරීමට තීරණය විය.**

**එම තීරණය සඳහා එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2023/03(07)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් සභාවේ මූල්‍ය අර්බුදයක් පවතින බැවින් වාහන සේවා මධ්‍යස්ථානයට උපකරණ හා ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 189- 6001- 00011061 -2 ගිණුම් අංක දරණ ස්ථාවර තැන්පතුවෙන් රු.2,000,000.00 ලබා ගෙන වියදම් දැරීම සඳහා සභා අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී එල්.එච්. කරුණාසේන දයාතිලක මයා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී**

**එම අවස්ථාවේ පැමිණ රැදී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සම්මත විය.**

**යෝජනා අංක 06/2023/03(08)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් ආරම්භ කිරීමට යෝජිත වාහන සේවා මධ්‍යස්ථානයේ සේවා කටයුතු ආරම්භ කිරීම සඳහා රජයේ වාහන හා පෞද්ගලික වාහන සඳහා මිළ ගණන් සාකච්ඡා කර තීරණය කර ගැනීම සඳහා සභා අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

**ගරු උප සභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මහතා**

ගරු සභාපතිතුමනි, මේ මස 10 වන දිනට ආරම්භ කිරීමට වැඩපිළිවෙල සකස් කර තිබෙනවාද යන්න විමසන ලදී. ඉක්මනින් එය ක්‍රියාත්මක කළොත් හොඳ යැයි ද ප්‍රකාශ කරන ලදී. රජයේ වාහන වලට පමණක් නොව පෞද්ගලික වාහන ද සේවා කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. සභාවේ අපේ කාලයත් අවසන් වී ගෙන යන නිසා මෙය ඉක්මනින් ක්‍රියාත්මක වීමසුදුසු බව පෙන්වා දෙන ලදී.

**ගරු උප සභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා**

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව ගොඩක් කල් සිට ක්‍රියාත්මක වීමට නියමිත දෙයක් නිසා අපේ සභා බල කාලය ඉවර වීමට පෙර මෙය පටන් ගැනීම සුදුසු බවත් මේ ප්‍රදේශයේ පවතින මිළ ගණන් වලට අඩුවෙන් සහනදායී මිලට ප්‍රදේශයේ ජනතාවට තමන්ගේ වාහනය සේවා කර ගැනීමට හැකි වන පරිදි රජයේ හා පෞද්ගලික වාහන සියල්ල සේවා කිරීම සිදුවිය යුතු යැයි මා විසින් යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී. සාධාරණ මිළක් විය යුතු බවත් පුද්ගලික මිළට තරඟකාරීවන ආකාරයට අඩු මුදලට වාහන සේවා සිදු විය යුතු බව ප්‍රකාශ කරන ලදී. වටපිටාවේ දැනට පවතින මිළ සොයා බලා ඒ අනුව කටයුතු කිරීම සිදුවිය යුතු බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපතිතුමා**

අවට පවතින සේවා ස්ථාන 05 ක පමණ මිළ ගණන් බලා එම මිලෙන් 15%ක් පමණ අඩු කර මිල තීරණය කිරීම සුදුසු දැයි විමසන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ජේ.ආර්. ජගත් ප්‍රසන්න මහතා**

එම තීරණයේ ගැටළු සහගත තත්ත්වයක් පවතින බවත් වාහනයක් සේවා කරන විට ඔයිල්වල මිළ ගණන් තිබෙන බවත් අමතර කොටස් වල මිළ ගණන් තිබෙනවා එමනිසා 15%ක් යැයි එකවර අපි හැදුවාම අමතර කොටස් හා ඔයිල් වල මිළ ගණන් සමඟ ඔය කියන මුදලට යා නොහැකි බව ප්‍රකාශ කරන ලදී. එමනිසා සේවා ගාස්තුවෙන් සියයට ගණන අඩුවිය යුතු බව පෙන්වා දෙන ලදී.

**ගරු උප සභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා**

සභාවේ සේවකයන් විසින් මෙම සේවය සපයන නිසා සේවා ගාස්තුවෙන් 20% ක් වැනි මුදලක් අඩු කළාට ගැටළුවක් නොමැති බවත් මහජනතාවට සේවයක් සිදුවිය යුතු නිසා එසේ කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපතිතුමා**

මෙම කාරණයේදී වාහන සේවා කිරීම සිදු කරන්නේ බහු කාර්ය සහයකු ලෙස සේවය කරන රොෂාන් මහතා බවත් ඔහුට වැටුප ලෙස ලැබෙන්නේ රු. 22500.00 ක මුදලක් බවත් එමනිසා එම වාහන සේවා කිරීමේදී ඔහුටත් යම් මුදලක් ලැබෙන ආකාරයට කටයුතු කරන්නට පුළුවන් නම් ඉතා හොඳ බව පෙන්වා දෙන ලදී. එක් වාහනයක් සේවා කළ පසු එම වාහනයේ සේවා මුදලින් 10% ක් වැනි මුදලක් ඔහුට ලැබෙන ලෙස තීරණයක් ගත යුතු බව පෙන්වා දෙන ලදී. තවත් සහයකයකුත් ඔහුට සහය වන නිසා ඔවුන් දෙදෙනාට සේවා ගාස්තුවෙන් 10% ක වැනි මුදලක් ලබා දීමට කටයුතු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී.

**ගරු උප සභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා**

වාහන සේවා කිරීමේදී අවට වාහන සේවා මධ්‍යස්ථාන වල සේවා ගාස්තු සළකා බලා එම සේවා ගාස්තු වලින් 20% ක් අඩුවෙන් අය කිරීමටත් එම සේවා ගාස්තුවෙන් 5% ක මුදලක් වාහන සේවා කරන සේවක මහතාට සහ සහයක මහතාට ලබා දීමටත් සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

**අවට වාහන සේවා ස්ථානවල මිළ ගණන් සසඳා බලා එම වාහන සේවා මධ්‍යස්ථාන වල සේවා ගාස්තුවෙන් 10% ක් අඩු කර වාහන සේවා කිරීමේදී අය කිරීමටත් වාහන සේවා ගාස්තුවෙන් 7% ක් සේවා කරන සේවක මහතාටත් සේවා ගාස්තුවෙන් 3%ක් සහයක මහතාටත් ලබා දීමට තීරණය විය.**

**එම තීරණය එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව සම්මතවිය.**

**යෝජනා අංක - 06/2023/03(09)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් මාස 06 ක පරිගණක පුහුණු කටයුතු සඳහා කල්පනි විබුද්ධා මහත්මියට අවස්ථාව ලබා දීමට සහා අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී පී.කේ. තරිඳු තුෂාන් ධනංජය මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව එම යෝජනාව සම්මත විය.**

**යෝජනා අංක - 06/2023/03(10)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ලැබුණු ලිපියට අනුව වැඩිහිටියන් සඳහා දිවා කාලයේ රැඳී සිටීමට වීරගොඩ හා ගොනාගොල්ල උහන ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිලි 02 ක ප්‍රතිසංස්කරණය සඳහා සහා අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Co

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | PL/03/16/16(2023) | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.02.08 |

සියලුම පළාත් පාලන කොමසාරිස්වරුන්,

<u>2023 වර්ෂයේ වෙන් වී ඇති ප්‍රතිපාදන මගින් පළාත් පාලන ආයතනවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ අංක PL/03/16/16(2023) හා 2023.01.18 දිනැති ලිපියට අවධානය යොමු කරමි.

02. එම ලිපිය මගින් 2023 වර්ෂය සඳහා වෙන් වී ඇති සීමිත ප්‍රතිපාදන සලකා බලා ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු ලබා දෙන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව එම ලිපිය මගින් අපේක්ෂිත තොරතුරු කඩිනමින් මෙම අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

03. එම ලිපියේද සඳහන් පරිදි පළාත් පාලන ආයතන මූලික වී ප්‍රදේශයේ වැඩිහිටි ජනතාවගේ මානසික සංවර්ධනය උදෙසා ගත හැකි ක්‍රියාමාර්ගයක් ලෙස වැඩිහිටියන්ට දිවා කාලය ගත කිරීම සඳහා සුදුසු ස්ථාන සකස් කිරීම යෝග්‍ය බව මෙම අමාත්‍යාංශය මගින් හඳුනා ගෙන ඇත. තවද අංක 03/2023 හා 2023.01.20 දිනැති ස්වදේශ කටයුතු චක්‍රලේඛය මගින් හඳුන්වා දී ඇති "අලුත් ගමක් - අලුත් රටක්" වැඩසටහන යටතේද පුද්ගලානුබද්ධ හා සමාජ සංවර්ධනය ආශ්‍රිත උපාය මාර්ග හඳුනා ගැනීමේදී වැඩිහිටි පිරිස ගැන බලා ගැනීම පිළිබඳ අවධානය යොමු කර ඇත.

04. ඒ අනුව එක් එක් පළාත් පාලන ආයතන යටතේ දැනට භාවිතයට නොගන්නා ගොඩනැගිලි උපයෝගී කර ගනිමින් වැඩිහිටියන් වෙනුවෙන් දිවා කාලය ගත කිරීමට සුදුසු ස්ථානයක් ඇති කිරීමට සෑම පළාත් පාලන ආයතනයක්ම යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. ප්‍රදේශයේ ජනතාවට කෙරෙන සමාජ සත්කාරයක් බැවින් මේ සඳහා හැකිතාක් දුරට අවශ්‍ය පහසුකම් සැලසීම හා පවත්වාගෙන යාම අදාල පළාත් පාලන ආයතන මගින් සිදු කිරීමට දැනුවත් කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk

05. තවද මේ සඳහා විශේෂිතව වෙන් කල ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශයටද නොමැති බැවින් මෙවැනි ස්ථාන ආරම්භ කිරීම සඳහා සුළු අලුත්වැඩියාවන් හා අත්‍යවශ්‍ය උපකරණ මිලදී ගැනීමට අවශ්‍ය පළාත් පාලන ආයතන පවතී නම් ඒ සඳහා වන ඇස්තමේන්තු සකසා උක්ත ලිපියට ඉදිරිපත් කරන යෝජනා ලෙස ඇතුලත් කර කඩිනමින් මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි.

මේ සඳහා ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකතන : 011-2307719 ෆැක්ස් : 011-2337181 විද්‍යුත් ලිපිනය : addsec.dev@pclg.gov.lk

පිටපත :
01.ප්‍රධාන ලේකම්,..................................පළාත
02.සහකාර පළාත් පාලන කොමසාරිස්, ................................දිස්ත්‍රික්කය
} කරු දැ.ගැ.ස. සහ අ.ක.ස.

ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී පී.ඒ.අයි.සන්ධ්‍යා පලිහක්කාර මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපතිතුමා**

සභාවට අයිති ගොඩනැගිලි 02 ක වැඩිහිටියන් සඳහා දිවා කාලයේ රැස්වීම් කටයුතු කිරීමට ලබා දීමට ප්‍රතිසංස්කරණය කිරීම සඳහා බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදී.

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව එම යෝජනාව සම්මත විය.**

**ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 11.15 ට තේ විවේකය සඳහා සභාව කල් තබන ලදී.**

**ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 11.50 ට තේ විවේකයෙන් පසුව නැවත සභාව ආරම්භ කරන ලදී.**

ඔරලෝසු වේලාවෙන් පෙ.ව. 11.25 ට ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා පැමිණෙන ලදී.

**යෝජනා අංක - 06/2023/03(11)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් උහන වසා දමා ඇති කඩ කාමර 02 ක ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.**

**එම අවස්ථාවේ පැමිණ රැඳී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත ඒකමතිකව එම යෝජනාව සම්මත විය.**

**යෝජනා අංක - 06/2023/03(12)**

ගරු සභාපති ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මහතා විසින් මැතිවරණ සීමා නීර්ණ කොමිෂන් සභාව විසින් සීමා නීර්ණය කිරීම පිළිබඳ විරෝධය දැක්වීම සඳහා සභා අනුමැතියට යෝජනා කොට ඉදිරිපත් කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.**

**ගරු සභාපතිතුමා**

සීමා නීර්ණය කොමිෂන් සභාව මඟින් සීමා නීර්ණය කිරීමේදී ප්‍රාදේශීය ලේකම්වත් අපිවත් නොදැන සීමා නීර්ණය කර ඇති බවත් කුමාරිගම ගත් විට වසම් 11 ක් ඇති බවත් 50% ක් අඩු කරනවා කිව්වාට එලෙස කළ නොහැකි බවත් උහන ග්‍රාම නිලධාරී වසම් 55 ක් එකවරම 50%ක් අඩු කරන්නට යාමේදී යම් යම් ගැටළු මතුවන බවත් පෙන්වා දෙන ලදී. මැතිවරණ නීර්ණය කොමිෂන් සභාවට ගොස් සාකච්ඡා කිරීමට හෝ අම්පාර සහකාර මැතිවරණ කොමසාරිස් සමඟ සාකච්ඡා කිරීමට හෝ පළාත් පාලන සහකාර කොමසාරිස් හරහා යම් ගැටළුක් ඉදිරිපත් කිරීමට හෝ අපේ විරෝධතාවයක් තිබෙන බව පෙන්වා සභා අනුමැතියක් ගත යුතු බව ප්‍රකාශ කරන ලදී. උදාහරණයක් ලෙස ගලපිටගල කොට්ඨාස දෙක හා මායාදුන්න හා සේනාගම උතුර දකුණ එක කොට්ඨාසයක් වන බවත් එසේම නවගිරියාව, ගොනාගොල්ල, වැරන්කැටගොඩ, බණ්ඩාරදූව එක කොට්ඨාසයක් වන බවත් මේ පිළිබඳව විමසිලිමත්ව බැලීමේදී ගැටළු සහගත තත්ත්වයක් පවතින බව ප්‍රකාශ කරන ලදී. භූ විෂමතාවය හඳුනා ගැනීමේදී සැබෑ ලෙසම ගැටළු තිබෙන බවද පෙන්වා දෙන ලදී. උහන ප්‍රාදේශීය සභාව තුළ භූ විෂමතා තත්ත්වයන් නිවැරදිව හඳුනාගෙන

සීමා නීර්ණය කිරීම සිදු වී නොමැති බවත් 50% ක් අඩු කරනවා කියා උහන කොට්ඨාස එකම විශාලත්වයෙන් නොමැති බවත් මෙහි ගැටළු සහගත තත්ත්වයක් ඇති බව පෙන්වා දෙන ලදී. මේ පිළිබඳව මැතිවරණ සහකාර කොමසාරිස්ගෙන් හා දිසාපතිතුමාගෙන් ඉල්ලීම් කළ බවත් අවසානයේදී උහන ප්‍රාදේශීය සභාව කොට්ඨාස 09 ක් කළ එක කෙසේ හෝ කොට්ඨාස 11 දක්වා වැඩි කරගත් බවත් අප විසින් ඉල්ලා සිටියේ කොට්ඨාස 13 ක් ලෙස කරන දෙන බවත් ඒ පිළිබඳව තවම කටයුතු සිදු වී නොමැති බවත් සමහර මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාස ඒ ආකාරයෙන්ම තිබෙන බවත් සමහර මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාස 03 ට 04 ට කැඩී අසාධාරණ තත්ත්වයන් මතුවී ඇති බවත් පෙන්වා දෙන ලදී. එමනිසා සියලු දෙනාම තම තමන්ගේ දේශපාලන නායකයින් සමඟ සාකච්ඡා කොට මැතිවරණ කොමිෂන් සභාවට යොමු කරන ලෙස ප්‍රකාශ කරන ලදී. මා විසින් 2011 වර්ෂයේදී එසේ යොමු කර හදාගත් බවත් මාගේ, මහකණ්ඩිය, කහටගස්යාය, වැලිකහගොල්ල පමණක් තිබුණ බවත් දෙමටමල්පැලැස්ස ඉවත් කර තිබූ බවත් මා විසින් එය ලිඛිතව ඉවත් කර සාදාගත් බවත් පෙන්වා දෙන ලදී. සීමා නිර්ණ කොමිෂන් සභාවට ලිඛිතව පෙන්වා දුන් විට ඒ පිළිබඳව සළකා බලන බවත් එමනිසා සියලු දෙනාම එක්වී සහයෝගයෙන් කටයුතු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකානයක මහතා**

මැතිවරණ සීමා නීර්ණ කොමිෂන් සභාව නැවත මාසයකට දින දීර්ඝ කර ගැනීමක් සිදු කර ගත් බවත් මේ සභාව තුළින් ඒකමතිකව ගනු ලබන තීන්දුව මැතිවරණ සීමා නීර්ණ කොමිෂන් සභාවට ලිඛිතව ඉදිරිපත් බල යුතු බවත් දිසාපතිතුමාටත් එය ඉදිරිපත් කළ යුතු බවත් කථානායකතුමාටත් අගමැතිතුමාටත් එය ලිඛිතව ඉදිරිපත් කළ යුතු බව පෙන්වා දෙන ලදී. එය පිටපත් 04 කින් යැවිය යුතු බව ප්‍රකාශ කරන ලදී. මෙය සාර්ථක වීමටනම් එසේ කළ යුතු බව ප්‍රකාශ කරන ලදී. කොට්ඨාස 11 කට හැදුවොත් කාටවත් අසාධාරණයක් නොවිය යුතු බව පෙන්වා දිය යුතු බවත් මා උදාහරණයක් ලෙස ගත්විට උදාගිරිගම නැගෙනහිර බටහිර උහන නගරය ගලහිටියාගොඩ මට දමා නැති බවත් එවිට පාළම් කඳවුර මගෙන් ඉවත්වී ඇති බවත් මේවා ගැටළු සහගත බවත් ගෙන්වා දෙන ලදී, පාර්ලිමේන්තුවේ පක්ෂයේ අයගෙන් පමණක් නොව විපක්ෂයේ අයගෙන්ද අදහස් ලබා ගන්නා බවත් සියලු දෙනාගේ අදහස් සංකලනය කර මධ්‍යස්ථ තැනක සිට මෙය සිදු කරාවි යැයි ප්‍රකාශ කරන ලදී. පුළුවන්නම් ජනතාව පැමිණිල්ලක් සිදු කළ යුතු යැයි ද ප්‍රකාශ කරන ලදී. මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිල්ල ඉදිරිපත් කළ යුතු බවද පෙන්වා දෙන ලදී. අපේ අයිතිවාසිකම් තිබෙන පැතිවල කොට්ඨාස බෙදීමෙන් අගතියක් වන බව පෙන්වා විධිමත් ආකාරයට මේ කොට්ඨාස බෙදීමට මැදිහත්වන ලෙස පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකි බවද පෙන්වා දෙන ලදී. පොදුවේ අපි කිහිප දෙනෙක් එකතුවී මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිල්ලක් දැමීම සුදුසු බව පෙන්වා දෙන ලදී. මා මේ පැවසූ ආකාරයට ලිපි දින 04 ක් 05 ක් ඇතුලත ඒ ඒ අදාළ ආයතන සඳහා යැවීම සිදුවිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මහතා**

සීමා නීර්ණවලදී දැනටත් අසාධාරණයක් වී ඇති බවත් ඉදිරියටත් එවැනි තත්ත්වයන් නොවීමට කටයුතු සිදු කළොත් ඉතා හොඳ බවත් මාගේ කොට්ඨාසයේ උදයපුර ගමේ ඉස්සරහා වෙළඳසැල් ටික රජගමට අයිති වී ඇති බවත් අපි බඩු ගන්නා කඩයට පාරේ එහා පැත්තේ තිබුණත් රජගමට අයිතිවී ඇති බවත් සීමා නීර්ණ වලදී එවැනි අසාධාරණකම් සිදුවී ඇති බව පෙන්වා දෙන ලදී. උදාහරණයක් ලෙස දහ අටේ කොළණියේ දකුණු කොටස මෙයට එකතු කළොත් ප්‍රශ්නයක් නැති බවත් වඩයන්තලාව කොටස එකතු කළොත් ලොකු අසාධාරණයක් වන බවත් පෙන්වා දෙන ලදී. එවැනි අවස්ථාවල පැමිණිලි කරන විට අපිත් එකතු කරගෙන කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

**මෙම සභාවේදී දක්වන ලද අදහස් ඉදිරිපත් කර මැතිවරණ සීමා නීර්ණ කොමිෂන් සභාවේ සභාපතිතුමා සීමා නීර්ණය කරන ආකාරයට විරෝධය දක්වා ලිඛිතව ලිපියක් ඉදිරිපත් කිරීමටත් එහි පිටපත් අතිගරු ජනාධිපතිතුමාට, අග්‍රාමාත්‍යතුමාට, කතානායකතුමාට, පලාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමාට, දිසාපතිතුමාට, සහකාර මැතිවරණ කොමසාරිස් තුමාට, පලාත් පාලන කොමසාරිස්, පලාත් පාලන සහකාර කොමසාරිස්තුමාට, ප්‍රාදේශිය ලේකම් තුමාට යොමු කිරීමට තීරණය විය .**

**එම තීරණයට එම අවස්ථාවේදී පැමිණ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ ඒකමතික කැමැත්ත මත සභා අනුමැතිය ලබා දෙන ලදී.**

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා**

මෙම සභාවේ යෝජනා සහ ආදායම් වියදම් සම්මත කිරීම සඳහා විශේෂ සභාවක් අවශ්‍ය බැවින් විශේෂ සභාවට දිනයක් ලබා දෙන ලෙස යෝජනා කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.**

**ගරු සභාපතිතුමා**

මහ සභාවේ ඒකමතික ඉල්ලීම මත මාර්තු මස 14 වන දින විශේෂ සභාවක් කැඳවන බව ප්‍රකාශයට පත් කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා**

අප සියලු දෙනාම ගරු කටයුත්තක් ලෙස සළකා ඉතා ආඩම්බරයෙන් මන්ත්‍රීරයෙකු ලෙස පත්වී පැමිණි බවත් හැත්තෑදාහක් පමණ ජීවත් වන උහන කොට්ඨාසයේ 48000 කගේ ඡන්දයෙන් පත්වී පැමිණ ගමට යම් සේවයක් කිරීමට ප්‍රදේශයට යම් සේවයක් කිරීමට ලැබුණ එම අවස්ථාව ගරු කටයුත්තක් ලෙස පත්වී පැමිණි බවත් නමුත් වර්තමානයේ මේ තිබෙන තත්ත්වය සමඟ පත්වී සිටින පක්ෂ විපක්ෂ සියලු දෙනා එසේම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225 දෙනාම හොරු යැයි සමහරු පවසන බවත් නමුත් බහුතරයකගේ කැමැත්ත අදටත් ඉතිරිවී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. අපි වී ටිකක් සෝදන විට බොල් වී ටිකකුත් උඩ පාවෙන බවත් ඒවාගේ යම් කිසි සුළු පිරිසක් සාමාන්‍ය ජනතාව ප්‍රයෝජනයට අරගෙන තමන්ගේ දේශපාලන බලපුළුවන්කාරකම් දේශපාලන අවශ්‍යතාවයන් ඉෂ්ට කර ගන්න මෑත කාලයේ බහුතරයක් උත්සාහා ගන්නා බවත් පැහැදිළි කරන ලදී. මිනී මතින් ගොස් හෝ තමන්ට බලය අල්ලා ගැනීමට වෙහෙසෙන කොටසක් සිටින බවත් බොරදියේ මාළු බාන පිරිසක් සිටින බවත් ප්‍රකාශ කරන ලදී. එමනිසා අපි මහජන නියෝජිතයන් ලෙස ඉතා ශක්තිමත්ව ආත්ම විශ්වාසයෙන් යුතුව කටයුතු කළ යුතු බවත් පෙන්වා දෙන ලදී. පැහැදිළිවම දේශපාලනයේ රැඳී සිටිනවානම් තමන්ගේ ගරුත්වය කොයිම මොහොතකවත් කෙලෙසන්න දෙන්න එපා යැයි ප්‍රකාශ කරන ලදී. සමහර දේශපාලනය කරත් සමාජයට බියකින් පසුවන බව මා දන්නා බවත් තමන් නිවැරදි නම් තමන් වංචා කර නැත්නම් තමන් හොරකම් කර නැත්නම් කිසිම අකටයුත්තක් කර නැත්නම් සමාජයට යම් මෙහෙවරක් කරපු උදවිය නම් කිසිම අවස්ථාවක ඕනෑම තැනකට මුහුණ දෙන්නට බය විය යුතු නැති බවත් ප්‍රකාශ කරන ලදී. තමන්ගේ ගරුත්වය තබාගෙන කටයුතු කළ යුතු බව පැහැදිළි කරන ලදී. අයට පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මන්ත්‍රීවයෙකුට උපකාරය සහයෝගය දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. යම් මන්ත්‍රීවරයෙකු අපහසුතාවයකට පත්වෙනවානම් තවත් කෙනෙකු වෙනුවෙන් පෙනී සිටින්නට හැකියාව තිබිය යුතු බවත් විශේෂයෙන්ම මම මෙය කීමට හේතු වන්නේ සමහර අවස්ථාවල මන්ත්‍රීවරයෙකුට ලැබිය යුතු ගෞරවය සමාජයෙන් නොලැබුණාට ප්‍රශ්නයක් නැති බවයි. සමහර පිරිස් චෝදනා කරන විට සමහර අය තමන්ගේ වචන පාවිච්චි කිරීමට බයේ සිටින බවත් ප්‍රකාශ කරන ලදී. හොඳ පුද්ගලයාටත් හොඳක් නොකියා සිටින තත්ත්වයක් දැන් උද්ගත වී ඇති බව ප්‍රකාශ කරන ලදී. රාජ්‍ය අංශයේ උත්සව අවස්ථාවල යම් උසස් පිරිස් සහභාගීවන අවස්ථාවල අපේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායම පහළට දමා වැඩ කටයුතු සිදුවූ අවස්ථා මෑත කාලයේ විශාල වශයෙන් තිබුණ බවත් ප්‍රකාශ කරන ලදී. අපි නිවැරදි නම් ඒවාට විරුද්ධව හඬක් නඟන්නට අපට පුළුවන් විය යුතු බව ප්‍රකාශ කරන ලදී. මන්ත්‍රී දූරය කියන වචනය අපිට ලැබී තිබෙන්නේ අපට නීත්‍යානුකූල තත්ත්වයක් ඇති කරන්නට පමණක් බවත් මේ සියලුම දෙනා ගමේ යම් සමාජ මෙහෙවරක් සිදු කරමින් සිටින පුද්ගලයන් බවත් පැහැදිළි කරන ලදී. එමනිසා මන්ත්‍රීවරුන්ගේ තත්ත්වය ආරක්ෂා කරගෙන ඉදිරි මැතිවරණ වලට සහභාගී වන සියලු දෙනා තමන්ගේ ආත්ම විශ්වාසයෙන් කටයුතු කරන්න යැයි මා විසින් ඉල්ලා සිටින බවත් අද දකින මුහුණු නැවත ප්‍රාදේශීය සභාව තුළදී දකින්නට

ලැබේවා යැයි ප්‍රාර්ථනා කරමින් මෙතෙක් කල් අපේ වචන වලින් යම් යම් හිත් රිදවීම් වූවානම් සමාව ඉල්ලා සිටින බවත් පෞද්ගලිකව අපේ ජීවිත වලට ඈදා ගෙන අපි දියුණු වෙන්න හිතාගෙන එසේ වචන ප්‍රකාශ නොකළ බවත් පැහැදිලි කරන ලදී. එසේම මෙතෙක් කල් ලේකම්තුමිය හා නිලධාරි මණ්ඩලය දැක්වූ සහයෝගයට ස්තූති කරන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා**

2012 වර්ෂයේ උහන උදාගිරිගම මාර්ගය ගොවි සංවිධාන වැනි සමිතියකින් කොන්ක්‍රීට් කළ බවත් ඒ කරපු අය එය හරියාකාරව නිම නොකළ බවත් දූර්වලතා තිබුණු බවත් මා සභාපතිවරයා වශයෙන් සිටි කාලයේ එහි රැඳවුම් මුදල් නොගෙවූ බවත් ප්‍රකාශ කරන ලදී. එම රැඳවුම් මුදල් ප්‍රාදේශීය සභාවේ තිබෙන බවත් එම රැඳවුම් මුදල් නිදහස් කරන්නට යැයි නොපවසන බවත් එම මාර්ගය දැන් විශාල වළවල් ප්‍රමාණයක් හැදී ඇති බැවින් එම මුදල උපයෝගී කරගෙන එම වළවල් ටික වසා මාර්ගය පිළිසකර කර දෙන ලෙස ප්‍රකාශ කරන ලදී. කාර්මික නිලධාරියාගෙන් යම් වාර්තාවක් අරගෙන එම පාර සාදා දෙන ලෙස යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා**

මම එම යෝජනාව ස්ථිර කරන බවත් රැඳවුම් මුදල් තබා ගෙන තිබෙනවානම් එය සාදා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී. රැඳවුම් මුදල් තබා ගන්නේ එවැනි කටයුතු වලට බව ප්‍රකාශ කරන ලදී. සුසන්ත මන්ත්‍රීතුමා අත්‍යවශ්‍ය කටයුත්තකට එළියට ගිය බවත් එතුමා විසින් මතක් කළ කරුණක් වන සුභදගම ප්‍රදේශයේ පාරේ පොඩි වලක් තිබෙන බවත් එය පසුගිය කාලයේ පස් ප්‍රවාහනය කිරීම නිසා කොන්ක්‍රීට් පාරේ වලක් සෑදී ඇති බවත් එයටත් සාමාන්‍ය මුදලක් වැය වන බවත් සාමාන්‍යයෙන් රු. 5000.00 ක මුදලක් වැය විය හැකි බවත් එය එම පාරත් සාදා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මහතා**

21 කොළණියේ පාරේ පාර දෙපැත්ත කැළෑවෙන් වැසී ඇති බවත් එය සුද්ද කර දීම තුළින් ජනතාවට බියක් සැකක් නැතුව පාරේ ගමන් කිරීමට හැකි වන බවත් එම පාර දෙපැත්ත මෝටර් ග්‍රේඩර් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

07. කාරක සභාවල වාර්තා - නැත

08. 2023 පෙබරවාරි මස ආදායම් වියදම් වාර්තාව ඉදිරිපත් කිරීම

## ආදායම් විග්‍රහය -2023 පෙබරවාරි

| | | | | |
|---|---|---|---|---|
| 01. පොදු පරිපාලන | වරිපනම් | රු: | 59,354.41 | |
| | ව්‍යාපාර බදු | රු: | 159,800.00 | |
| | බයිසිකල් | රු: | | |
| | වීථිරේඛා සහතික | රු: | 3,000.00 | |
| | වරිපනම් දඩ | රු: | | |
| | වරිපනම් දඩ/උසාවි දඩ | රු: | | |
| | පොරම ගාස්තු | රු: | 4,090.00 | |
| | අභ්‍යන්තර බිලකිරීම් | රු: | | |
| | සේවක ණය පොලී | රු: | 11,291.44 | |
| | වැටුප් ප්‍රතිපූරණය | රු: | 2,065,254.69 | |
| | එකතුව | රු: | | **2,302,790.54** |
| 02.සෞඛ්‍ය සේවා | වෙළඳ බලපත්‍ර | රු: | 17,000.00 | |
| | ව්‍යාපාර බදු | රු: | | |
| | පරිසර බලපත්‍ර | රු: | | |
| | පරිසර බලපත්‍ර පරීක්ෂාව | රු: | | |
| | සුනඛ එන්නත් | රු: | | |
| | වැටුප් ප්‍රතිපූරණය | රු: | 344,860.00 | |
| | එකතුව | රු: | | **361,860.00** |
| 03.භෞතික සැලසුම් | ගෙවල් කුලී | රු: | | |
| | කුලියට දීම (භූමිය) | රු: | 4,000.00 | |
| | කුලියට දීම් (වාහන) | රු: | 14,000.00 | |
| | දීර්ඝ කාලීන බලපත්‍ර | රු: | | |
| | ගොඩනැගිලි පරීක්ෂාව | රු: | 19,800.00 | |
| | සැලසුම් ශිල්පීන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | රු: | | |
| | අයකර ගතහැකි ගාස්තු | රු: | | |
| | වැටුප් ප්‍රතිපූරණය | රු: | 344,595.82 | |
| | එකතුව | රු: | | **382,395.82** |
| 04.ජල සේවා | ජල බවුසරය | රු: | | |
| | නල ළිං | රු: | | |
| | එකතුව | රු: | | - |
| 05.උපයෝගී සේවා | කඩකාමර කුලී | රු: | 41,407.16 | |
| | මස්කඩ | රු: | | |
| | පොල බදු | රු: | 103,350.00 | |
| | අයකර ගතහැකි ගාස්තු | රු: | | |
| | පොළ/කඩකාමර ප්‍රමාද ගාස්තු | | 308.33 | |
| | එකතුව | රු: | | **145,065.49** |
| 06.සුභසාධන සේවා | විනෝද බදු | රු: | | |
| | ප්‍රචාරක දැන්වීම් පුවරු | රු: | | |
| | ගවයන් ඇල්ලීම | රු: | | |
| | පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු | රු: | 742.00 | |
| | වැටුප් ප්‍රතිපූරණය | රු: | 89,920.00 | |
| | එකතුව | රු: | | **90,662.00** |
| | පුනරාවර්තන ආදායම් එකතුව | රු: | | **3,282,773.85** |
| | ප්‍රාග්ධන ආධාර | රු: | 3,239,561.94 | **3,239,561.94** |
| | එකතුව | රු: | | **6,522,335.79** |
| වෙනත් ලැබීම් | පුස්තකාල තැන්පත් | රු: | 3,610.00 | |

| | | | |
|---|---|---|---|
| සේවක ණය | රු: | 49,250.00 | |
| කර්මාන්ත තැන්පත් | රු: | | |
| ටෙන්ඩර් තැන්පත් | රු: | | |
| මුද්දර තැන්පත් | රු: | 3,125.00 | |
| විවිධ තැම්පත් | රු: | 269,456.19 | |
| අත්තකාරම පියවීම | රු: | 5,893.87 | |
| මුදල් මාරු | රු: | | |
| ණය ගැති | රු: | | |
| එකතුව | රු: | | 331,335.06 |
| මුළු එකතුව | | | 6,853,670.85 |

සකස් කලේ :

පරීක්ෂා කලේ:

ලේකම්.
ප්‍රාදේශීය සභාව.
උහන.

එම්.ඒ.පී. මැදගොඩ
ලේකම්
ප්‍රාදේශීය සභාව
උහන

## උහන ප්‍රාදේශීය සභාවේ මාසික ඒකාබද්ධ වැය සාරාංශය
## 2023 පෙබරවාරි මාසය

| | | |
|---|---|---|
| 1 | අතිකාල ගෙවීම | |
| | 01. ඩී.එම්. තිස්ස කුමාර මයා (2023 ජනවාරි මස පැය 36 ක් සඳහා) | 4,619.88 |
| | 02. ඒ. වික්‍රමරත්න මයා (2023 ජනවාරි මස පැය 32 ක් සඳහා) | 3,499.84 |
| | 03. කේ.පී. සුගත් සමරවීර මයා (2023 ජනවාරි මස පැය 60 ක් සඳහා) | 6,562.20 |
| | 04. ආර්.කේ.ජේ. වික්‍රමසිංහ මයා (2023 ජනවාරි මස පැය 60 ක් සඳහා) | 7,497.00 |
| | 05. ඒ. ප්‍රියන්ත කුමාර මයා (2023 ජනවාරි මස පැය 60 ක් සඳහා) | 6,999.60 |
| | 06. පී.ඒ.අයි.අයි. මැණිකේ මෙනවිය (2022 අවසන් ගිණුම සකස් කිරීමේ අධීක්ෂණ කටයුතු සඳහා 2022 දෙසැම්බර් මස පැය 16 1/2 ක් සඳහා) | 2,614.42 |
| | 07. එම්.එස්. දිසානායයක මිය (2022 දෙසැම්බර් මස පැය 14 ක් සඳහා) | 1,828.12 |
| | 08. පී.ඒ.ඩී.එස්.එස්. ප්‍රභානි මිය (2022 දෙසැම්බර් මස පැය 14 1/2 ක් සඳහා) | 2,117.58 |
| | 09. කේ.එම්.ඩබ්.එම්. රූපසිංහ මිය (2022 දෙසැම්බර් මස පැය 14 ක් සඳහා) | 1,924.30 |
| | 10. එච්.ඊ. සරත් කුමාර (ජනවාරි පැය 20) | 2,229.00 |
| 2 | ගමන් වියදම් | |
| | 01. පී.එල්.ඒ.කේ. ගල්කැටිය මයා උප අධ්‍යාපන කාර්යාලය අම්පාර (2021 භාණ්ඩ සමීක්ෂණයට අනුව භාණ්ඩ වෙන්දේසිය සඳහා සහභාගිවීමේ ගමන්වියදම හා දීමනාව ගෙවීම) | 950.00 |
| | 02. ඩී.එම්.තිලකාවති මිය ප්‍රජා සංවර්ධන නිලධාරී පා.පා.කො. කාර්යාලය අම්පාර (2021 භාණ්ඩ සමීක්ෂණයට අනුව භාණ්ඩ වෙන්දේසිය සඳහා සහභාගිවීමේ ගමන්වියදම හා දීමනාව ගෙවීම) | 1,540.00 |
| 3 | විදුලි බිල්පත් පියවීම | |
| | 01. උහන මහජන පුස්තකාලය (2022.12.30-2023.01.31) | 1,394.82 |
| | 02. ගොනාගොල්ල මහජන පුස්තකාලය (2023.01.05-2023.02.03) | 394.88 |
| | 03. ගොනාගොල්ල නිල නිවස (2023.01.05-2023.02.03) | 123.08 |
| | 04. වැරැන්කැටගොඩ පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 16 (2023.01.26 | 738.46 |
| | 05. වැරැන්කැටගොඩ පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 15 | 738.46 |
| | 06. ගොනාගොල්ල නිල නිවස (2022.12.03-2023.01.05) | 123.08 |
| | 07.ගොනාගොල්ල මහජන පුස්තකාලය (2022.12.03-2023.01.05) | 420.52 |
| | 08. උහන ප්‍රධාන කාර්යාලය (2022.12.30-2023.01.31) | 25,530.25 |

| | | |
|---|---|---|
| | 09. වීරගොඩ නව පුස්තකාලයේ විදුලි බිල්පත (2022.12.23- 2023.01.22) | 394.88 |
| | 10. වීරගොඩ නව පුස්තකාලයේ විදුලි බිල්පත (2022.12.23- 2023.01.22) | 394.88 |
| 4 | 01. ඒ.පී.ප්‍රදීප් පත්මචන්ද්‍ර මයා (2022 ජනවාරි මස දෛනික වැටුප් ගෙවීම) | 26,326.18 |
| | 02. ටී.පී.ඩී. හේමමාලි රණවීර මිය (2022 ජනවාරි මස දෛනික වැටුප් ගෙවීම) | 19,262.88 |
| | 03. එච්.එම්. ප්‍රදීප් සඳකැලුම් මයා (2022 ජනවාරි මස දෛනික වැටුප් ගෙවීම) | 29,820.45 |
| | 04. ඩී.එම්. දිලාන් තනුජ මයා (2022 ජනවාරි මස දෛනික වැටුප් ගෙවීම) | 22,902.68 |
| | 05. ඒ.ආර්.ඩී.පී.සී. බණ්ඩාර මයා (2022 ජනවාරි මස දෛනික වැටුප් ගෙවීම) | 29,855.49 |
| | 06. සේවක අර්ථසාධක අරමුදල (දෛනික වැටුප් අවකරණ) | 30,131.51 |
| | 07. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (දෛනික වැටුප් අවකරණ) | 4,519.71 |
| | 08. ප්‍රාදේශීය සභා සුභ සාධක සංගමය (දෛනික වැටුප් අවකරණ) | 4,062.50 |
| 5 | ජල බිල්පත් පියවීම | |
| | 01. නුගේලන්ද පොළ ජල බිල්පත (2022.12.13 - 2023.01.12) | 722.20 |
| | 02. ගොනාගොල්ල මහජන පුස්තකාලය ජල බිල්පත (2022.12.19 - 2023.01.19) | 639.40 |
| | 03. උහන පොදු වැසිකිළිය ජල බිල්පත (2023.01.09- 2023.02.08) | 1,005.10 |
| | 04. උහන පොලිසිය අසල ජල කරාමය ජල බිල්පත (2023.01.03- 2023.02.02) | 627.90 |
| | 05. ගොනාගොල්ල මහජන පුස්තකාලය ජල බිල්පත (2022.11.18- 2022.12.19) | 828.00 |
| | 06. උහන පොදු වෙළඳපොළ මාලුලැල්ල ජල බිල්පත (2023.01.07- 2023.02.06) | 4,027.30 |
| | 07. උහන ප්‍රධාන කාර්යාලය ජල බිල්පත (2023.01.18 - 2023.02.07) | 7,111.60 |
| | 08. නුගේලන්ද පොළ ජල බිල්පත (2023.01.12- 2023.01.24) | 816.50 |
| | 09. වීරගොඩ පොළ ජල බිල්පත (2022.12.24- 2023.01.24) | 356.50 |
| 6 | දුරකථන බිල්පත් පියවීම | |
| | 01. උහන ප්‍රධාන කර්යාලය දුරකථන බිල්පත ( 2022.12.01 - 2022.12.31) | 512.12 |
| | 02. කාර්යාලයේ දුරකථන බිල්පත (2022.12.01 - 2022.12.31) | 6,851.17 |
| | 03. උහන ප්‍රධාන කර්යාලයේ දුරකථන බිල්පත (2022.12.01 - 2022.12.31) 063-2250355 | 9,550.24 |
| | 04. දුරකථන බිල්පත (2023.01.01 - 2022.01.31) 063-2030900 | 6,851.17 |
| | 05. කාර්යාලයේ දුරකථන බිල්පත (2023.01.01 - 2023.01.31) 063-2250357 | 512.12 |
| | 06. කාර්යාලයේ දුරකථන බිල්පත (2023.01.01 - 2022.01.31)063-2250355 | 8,170.18 |
| | 07. කාර්යාලයේ දුරකථන බිල්පත (2022.09.01 - 2023.01.31) 063-2053050 | 22,730.97 |

| | | |
|---|---|---|
| | එච්.එම්.ඝාමිණී.භණ්ඩාර - ඉන්ධන බිල්පත පියවීම (2023.01.02- 2023.01.05) | 229,790.00 |
| 8 | සුළු මුදල් අත්තිකාරම් ලබා ගැනීම (2023) | 4,923.00 |
| 9 | ඩී.ඩී.ආරියපාල - පොත මිලදී ගැනීම | 2,128.00 |
| 10 | ලියාපදිංචි තැපෑල සඳහා මුද්දර ලබා ගැනීම | 2,500.00 |
| 11 | කේ.ඒ. සරත් ගුණසේකර - ඉන්ධන බිල්පත පියවීම (2023.01.23-2023.02.13) | 76,950.00 |
| 12 | විශේෂ අත්තිකාරම් 2023 | 144,000.00 |
| 13 | සූර්ය විදුලි පැනල් සවි කිරීම සඳහා පහන් කණු කොන්ක්‍රීට් මිලදී ගැනීම | 13,800.00 |
| 14 | මන්ත්‍රී දීමනා ගෙවීම - පෙබරවාරි | 480,000.00 |
| 15 | මධ්‍යවේදී දීමනාව - 2023.02.09 දින සභා රැස්වීම | 2,400.00 |
| 16 | ස්ථිර වැටුප් ගෙවීම - පෙබරවාරි | 2,536,642.25 |
| 17 | වාහන සේවා මධ්‍යස්ථානය ඉදි කිරීම හා වාහන සර්විස් කිරීමේ උපකරණ මිලදී ගැනීමට අදාල ගෙවීම් | 2,398,105.75 |
| | **එකතුව** | **6,202,068.12** |

හරස් සටහන් 323,282.51

**මුළු එකතුව** **6,525,350.63**

පරීක්ෂා කළේ :-

**ලේකම්,**

**ප්‍රාදේශීය සභාව,**

**උහන.**

එම්.[illegible]. මැදගොඩ
ලේකම්
ප්‍රාදේශීය සභාව
**උහන**

2023 වර්ෂයේ පෙබරවාරි මස ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තාව මහ සභාවේ දී ස්ථිර කරන ලදී.

09. 2023 පෙබරවාරි මස ධාවන සටහන් වාර්තාව ඉදිරිපත් කිරීම - නැත

10. වෙනත්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ නොපැමිණීම සම්බන්ධ ලිපි සහා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම .

**ගරු සභාපතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මහතා හදිසියේ අසනීප වූ නිසා රෝහල් ගත කර ඇති බව සභාවට දැනුම් දෙන බවත් එතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බවත් ප්‍රකාශ කරන ලදී.

නොපැමිණීම සම්බන්ධව ලිපි ඉදිරිපත් කර ඇති මන්ත්‍රීවරු

| | |
|---|---|
| 1. කේ.වී.ජී. නයනා කුමුදුනි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 2. ඩබ්. රාණි මැණිකේ මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 3. කේ.බී. විමලරත්න මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 4. ආර්.එම්. ජයවීර රත්නායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |

**ගරු සභාපතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්. අමරකීර්ති මහතා අද දින සභාවට නොපැමිණියද නොපැමිණීම සම්බන්ධ ලිපියක් ප්‍රාදේශීය සභාවට එවා නොමැති බවත් කේ.බී. විමලරත්න මහතාගේ නොපැමිණීම සම්බන්ධ ලිපියේ නිල මුද්‍රාව නොමැති නිසා එහි වලංගු භාවය පිළිබඳ ගැටළුවක් පවතින බවත් එම ලිපිය අනුමත නොකරන බව සභාවෙන් ඒකමතික තීරණය කරන නිසා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.බී. විමලරත්න මහතාගේ නොපැමිණීම සම්බන්ධ ලිපිය අනුමත නොකරන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ.බී. විමලරත්න මහතාගේ නිවාඩු ලිපිය අනුමත නොකරන බව සභාවෙන් ඒකමතිකව තීරණය කරන ලදී.**

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා**

සභාවේ සිටින මන්ත්‍රීවරු 31 දෙනාගෙන් 30 ක්ම හොරු බව ඔවුන් පවසන බවත් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා කිසිම වරදක් නොකරන සුදෝ සුදු පිරිසිදු පුද්ගලයෙක් බව ඔහුගේ ප්‍රකාශ වලින් තේරෙන බවත් මේ සභාවේ නිවාඩු ලබා ගත යුතු ක්‍රමවේදයක් තිබෙන බවත් ඒ ක්‍රමවේදය නම් විධිමත් ඉල්ලීමක් කර තිබිය යුතු හා තමන්ගේ අත්සන හා නිල මුද්‍රාව තැබිය යුතු බවයි. දැන් මේ ලිපිය විධිමත්ව භාර දීපු කෙනෙක් නැති බවත් නිල මුද්‍රාව නැති බැවින් එය විකෘතියක් බවත් මෙය අපට පිළිගැනීමට නොහැකි බවත් පෙන්වා දෙන ලදී. සභාවේ අපි වංචාකාරයින් ලෙස හංවඩු ගසන ජනතා විමුක්ති පෙරමුණ මේ කරන්නේ ද වංචාවක් බව ප්‍රකාශ කරන ලදී. රු. 15000.00 ක දීමනාව ලබා ගැනීම වංචාවක් බව ප්‍රකාශ කරන ලදී. අපි වංචාවට ඉඩ දිය නොහැකි නිසා විධිමත්ව නිවැරදි ආකාරයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම ලිපිය ප්‍රතික්ෂේප කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මහතා**

ගරු සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ රට වෙනුවෙන් අලුත් දෙයක් කරනවා වංචාව දූෂණය නැති කරනවා කියා පසුගිය දිනවල කෑ ගැසූ බවත් මේ උඩහ ප්‍රාදේශීය සභාව බලයට ගන්නවා කියා හීන මවාගෙන ඉන්න ජනතා විමුක්ති පෙරමුණ දැනට මේ වන විට ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්නේ එක් මන්ත්‍රීවරයෙකු පමණක් බවත් ඔහුත් එක් දවසක් ප්‍රාදේශීය සභාවට පැමිණෙනවා ඉන්පසු සභා වාර 02 ක් නොපැමිණෙන බවත් පනත අනුව මන්ත්‍රී ධූරයට ගැටළුවක් වේවි යැයි සිතන නිසා එසේ කරන බවත් අදත් පුටුව හිස් බවත් ප්‍රදේශයේ ජනතාවගෙන් වගකියනවා කියා මන්ත්‍රී ධූරය අරගෙන පැමිණි මනුස්සයා රට හැදිල්ල කෙසේ වෙතත් තමන්ගේ දීමනාව ගන්න පමණක් තමන්ගේ වැඩ කටයුතු කරගෙන යනවා කියන එක පැහැදිළි බව පෙන්වා දෙන ලදී. නමුත් ඔවුන් මාධ්‍ය හරහා පවසා සිටින්නේ ඔවුන් වැටුපක් ගන්නේ නැහැ රට වෙනුවෙන් සේවය කරන බවයි. නමුත් අපි දන්නා ආකාරයට මේ අනෙකුත් මන්ත්‍රීවරුන්ට වඩා

රු. 20.00 ක් හෝ වැඩියෙන් වැය වන්නේ මේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයාට බව පෙන්වා දෙන ලදී. මොකද චෙක්පතකින් එම දීමනාව ලබා දෙන නිසා සභාවට අමතර වියදමක් දැරීමට සිදුවන බව පෙන්වා දෙන ලදී. රංජිත් මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට නිවාඩු ලිපියේ දෝෂ තිබෙන බැවින් ප්‍රාදේශීය සභාව අනුගමනය කරන ක්‍රමවේදයක් තිබෙන බැවින් එම ක්‍රමවේදයෙන් පිට මෙතුමා නිවාඩු ඉල්ලීම් කර ඇති බැවින් එමනිසා රංජිත් මන්ත්‍රීතුමා විසින් ගෙනා යෝජනාව මා ස්ථිර කරන බවත් මේ සභාව විසින් විමලරත්න මන්ත්‍රීතුමාගේ නිවාඩු අනුමත නොකරන බව ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ මිනිස්සු මුලාවේ දමන බව ප්‍රදේශයේ ජනතාව දැන ගත යුතු බව ප්‍රකාශ කරන ලදී. අනගතයේ මේ ප්‍රාදේශීය සභාව භාර ගෙන සංවර්ධන කටයුතු කරනවා කිය කියා ඉන්න, එක මන්ත්‍රීවරයාවත් සභාවට එන්නේ නැති බව ප්‍රකාශ කරන ලදී. දීමනාව ගන්න පමණක් කඩදාසියක් ප්‍රාදේශීය සභාවට එවා ඇති බව පෙන්වා දෙන ලදී. එමනිසා මේ බොරු ප්‍රෝඩාවට අහුවෙන්න එපා යැයි මාධ්‍යවේදීන් විසින් ජනතාවට දැනුම් දිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා**

සභාවේ ගත් තීන්දුවක් අනුව මේ දීමනාව කිසිදු අයුරකින් ගෙවීම් නොකරන ලෙස ලේකම්තුමියට උපදෙස් දෙන ලදී. දීමනාව ගන්නේ නැහැ යැයි ඔවුන් සමාජ ගත කර ඇති බවත් නමුත් අපෙන් චෙක්පතක් මඟින් ඔවුන් දීමනාව ගන්නා බවත් චෙක්පතටත් අපට අමතර වියදමක් දැරීමට සිදුවන බව ප්‍රකාශ කරන ලදී. අනිත් සියලුම මන්ත්‍රීවරුන්ගෙන් මාධ්‍යවේදීන්ට දෙන දීමනාව අඩු කරන බවත් පසුගිය අවුරුදු දෙක තේ වියදම් අඩු කළ බවත් නමුත් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා ඒ කිසිම දෙයක් නැතිව රු. 15000.00 ක මුදල චෙක්පතකින් ලබා ගන්නා බව ප්‍රකාශ කරන ලදී.

**මූලාසනය.**

න්‍යාය පත්‍රානුකූලව අදට නියමිත වැඩ කටයුතු අවසන් බවත් මීළඟ සභාවාරය 2023.04.06 වන දින පෙ.ව. 9.30 මෙම ස්ථානයේදී පැවැත්වෙන බවත් දක්වන ලදී. එදින ප.ව. 1.30 ට පමණ සභා කටයුතු අවසන් කරන ලදී.

ලේකම්
ප්‍රාදේශීය සභාව
උහන.

2023/03/14 දින විශේෂ සභා රැස්වීමේදී සංශෝධන සහිතව/රහිතව සභා සම්මත කරන ලදී.

ගරු සභාපති.